# භරත නාට්‍යම්

## විෂය නිර්දේශය

## 9 ශ්‍රේණිය

(2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
**www.nie.lk**

# හැඳින්වීම

ප්‍රාථමික අධ්‍යාපනය හමාර කර, කනිෂ්ඨ ද්විතීයක අංශයේ 10 වන ශ්‍රේණියේ අධ්‍යාපනය ලැබීමට පැමිණෙන දරුවන්ට සුදුසු පරිදි භරත නාට්‍යම් නව විෂය නිර්දේශය සැලසුම් කර ඇත. නව අධ්‍යාපන අරමුණු හා සංකල්ප මෙහි අන්තර්ගතය.

මීට පෙර භරත නාට්‍යම්, කර්ණාටක සංගීතය, නාට්‍ය හා රංග කලාව ආදි, කලා විෂයන් සියල්ල එකට ඉගැන්වූ අතර, 2007 වර්ෂයේ සිට 6වන ශ්‍රේණිය සඳහා මේ විෂයන් වෙන වෙනම රස වින්දනය, නිර්මාණ කුසලතා, ක්‍රියාකාරකම්, දැනුම, සංස්කෘතික පසුබිම ආදී ලක්ෂණ පසුබිම් කරගත් ඉගෙනුම් නිපුණතා යටතේ මෙම විෂය නිර්දේශය සංශෝධනය කරන ලදි.

ලෝකය නොයෙකුත් වෙනස්වීම්වලට භාජනය වේ. ඊට අනුව කලා විෂය නිර්දේශවල ද වෙනස්කම් ඇතිවීම වැළැක්විය නොහැකි ය. ඕනෑ ම කලා විෂය නිර්දේශයක් අංශ 2ක් යටතේ වෙනස්කමකට භාජනය වේ.

1. විෂය කොටස් එකතු වීම - විෂය කොටස්වල වෙනස්කම් සිදු කිරීම, විෂය කරුණු පහසුවෙන් අවබෝධ කර ගැනීම.
2. විෂය කරුණු සිසුන් වෙත ළඟා කරවීම සඳහා ඉදිරිපත් කරන ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේද

ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයට මුල් තැන දෙන මෙම නව විෂය නිර්දේශය ශිෂ්‍යයන් හා ගුරුවරුන් එකතු ව ක්‍රියාත්මක කළ යුතු බව තහවුරු කරයි. සිසුන් විෂය කරුණු සොයා ගනිමින් ඉගෙනීමට පෙලඹවීමේ ක්‍රියාකාරකම් බොහෝ ගණනකින් මෙය සමන්විත ය. සිසුන් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රම පැහැදිලි ව අවබෝධ කරගෙන තමා ම, කැමැත්තෙන් මෙම කටයුතුවල නියැලීමට සුදුසු පරිදි මෙම විෂය නිර්දේශය සකස් කර ඇත.

පවතින අධ්‍යාපන ක්‍රමයේ වැදගත් අවස්ථා තුනක්

1. ලබාගත් දැනුම රැකගැනීම.
2. කලින් සැලසුම් කළ විෂය කරුණු ඉගෙනීම.
3. කලින් ඉගෙනගත් විෂය කරුණු නැවත ගොඩනගා ගැනීම.

මෙහි ඇති ක්‍රියාකාරකම් සිසුන් ඉගෙනගත් දේ වෙනසකට භාජනය කර, නව මුහුණුවරකින් නව සමාජයක් ගොඩනැඟීමට උත්සාහ දරයි. මේ සඳහා තරුණ සමාජය දැනුම්වත් කිරීම අවශ්‍ය යි. සොයාගැනීම්වල නියැලි, කලින් දැන සිටි දේ වෙනස් කර, මේ තාක් නොදැන සිටි දේ සොයා ඉගෙනීමට හුරු කිරීම මෙම විෂය නිර්දේශයේ අරමුණ යි.

පහසුවෙන් ජීවිකාව කරගෙන යාමට අවශ්‍ය කුසලතාවලින් හා දක්ෂතාවලින් පිරිපුන් යහපත් පෞරුෂයක් සඳහා අවශ්‍ය චින්තන හැකියාවන් (Thinking skills) සමාජ හැකියා (Social skills ) ස්වයං හැකියා (Personal skills) ආදිය වර්ධනය කිරීමේ අරමුණින් පාසල් කාලය තුළ ලබාදීමට බලාපොරොත්තු වන නව විෂය නිර්දේශයක් ලෙස මෙය හඳුන්වා දිය හැක.

ගැටලුවකට මුහුණදීමේ දී පෙර සූදානමක් ඇති කටයුතු කිරීමට හුරු කිරීම ඉතා ම අවශ්‍ය යි. එබැවින් හෙට දින ලෝකය ජය ගැනීමේ ඉලක්කය ඇතිව මෙම නව විෂය නිර්දේශය සකස් කර ඇත. මනා පෞරුෂයකින් හෙබි යහපත් පුරවැසියන් බිහි කිරීම මෙම විෂය නිර්දේශයේ අරමුණ යි.

## ජාතික පොදු අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟාවීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබීය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලින් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟා කර ගත යුතු පහත දැක්වෙන අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික සෘජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම

II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර, ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

III මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

IV පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැස්වීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

( උපටා ගැනීම - ජාතික අධ්‍යාපන කොමිසන් සභා වාර්තාව - 2003)

# මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු ඉටුකර ගැනීමට දායක වනු ඇත.

**(I) සන්නිවේදන නිපුණතා**

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය මත තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

සාක්ෂරතාව : සාවධාන ව ඇහුම්කන් දීම පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ, අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද, සේවා පරිශ්‍රයක් තුළ දී ද, පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

**(II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**

- නිර්මාණශීලීබව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය

**(III) පරිසරයට අදාළ නිපුණතා**

මෙම නිපුණතා සාමාජික ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

සමාජ පරිසරය : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පෞද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

ජෛව පරිසරය : සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීව - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදීබව හා කුසලතා

භෞතික පරිසරය : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ස්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

**(IV) වැඩ ලෝකයට සුදානම් වීමේ නිපුණතා**

- ආර්ථික සංවර්ධනයට දායක වීම
- තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම
- හැකියාවනට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසර ජීවනෝපායක නිරත වීම යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

**(V) ආගම සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා**

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

**(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**

සෞන්දර්යය, සාහිත්‍ය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

**(VII) ''ඉගෙනීමට ඉගෙනුම'' පිළිබඳ නිපුණතා**

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින්හට ශක්තිය ලබාදීම.

(උපුටා ගැනීම - ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව 2003)

## විෂය අරමුණු

- භරත නැටුම් සම්බන්ධ විෂය සමගාමී ක්‍රියාකාරකම් මඟින් දැනුම ආකල්ප හා කුසලතා ඇති කර ගනියි.
- නර්තන කලාකරුවකු වීමට අවශ්‍ය පෞරුෂයක් ගොඩනගා ගනියි.
- නිර්මාණාත්මක හැකියා දියුණු කර ගනියි.
- විවිධ වූ දේශීය කලා අධ්‍යයනය කර ඇගයීමට ලක් කරයි.
- සෞන්දර්යාත්මක ව රස වින්දනය කරයි.
- කලාකරුවන් ඇගයීමේ ආකල්ප දියුණු කර ගනියි.
- සම්ප්‍රදාය හා සංස්කෘතිය රැක ගැනීමේ ආකල්ප දියුණු කර ගනියි.
- තම හැකියාවන් අවබෝධ කරගෙන ප්‍රාසංගික කලා ඉදිරිපත් කිරීමේ කුසලතාව ලබයි.
- ජන සන්නිවේදන කුසලතාව ලබයි.
- ස්වයං ලෙස ඉදිරිපත් වී කැපවීමෙන් කටයුතු කිරීමේ කුසලතාවය ලබයි.
- ස්වාභාවික පරිසරය රස වින්දනය කර ප්‍රකාශ කිරීමේ කුසලතාවය ලබයි.
- නව තාක්ෂණික උපකරණ භාවිත කිරීමේ කුසලතාවය ලබයි.
- එදිනෙදා ජීවිතය සඳහා අවශ්‍ය මූලික අභ්‍යාස කරයි.
- ශිල්ප ක්‍රම අනුගමනය කරමින් නව නිර්මාණ ඉදිරිපත් කරයි.
- කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීමේ කුසලතාව ලබයි.
- විවිධ සංස්කෘතිවලට අයත් සමාජයක් තුළ මානව සම්බන්ධතා මනා ලෙස ගොඩ නගයි.
- සාමාජීය පිළිගැනීමට හා ප්‍රශංසාවට ලක්වෙයි.
- කලාවේ ඇති සියුම් දේවල් අධ්‍යයනය කර විස්තර කිරීමේ හා විමර්ශනය කිරීමේ කුසලතාව ලබයි.
- කලාව පිළිබඳ සොයා ගැනීම් කර ඒවා නවතාවකින් ඉදිරිපත් කරයි.

| ජාතික පොදු අරමුණු | විෂය අරමුණු |
|---|---|
| I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම | • සම්ප්‍රදායන් හා සංස්කෘතිය රැක ගැනීමේ ආකල්ප දියුණු කර ගනියි.<br>• විවිධ සංස්කෘතියන්ට අයත් සමාජයක් තුළ මානව සම්බන්ධතා මනා ලෙස ගොඩ නගයි. |
| II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම | • ශිල්ප ක්‍රම අනුගමනය කරමින් නව නිර්මාණ ඉදිරිපත් කරයි. |
| III මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම | |
| IV පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම | • කලාකරුවන් ඇගයීමේ ආකල්ප දියුණු කර ගනියි.<br>• තම හැකියාවන් අවබෝධ කරගෙන ප්‍රාසාංගික කලාවන් ඉදිරිපත් කිරීමේ කුසලතාවය ලබයි. |
| V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම | • භරත නැටුම් සම්බන්ධ විෂය සමගාමී ක්‍රියාකාරකම් මඟින් දැනුම ආකල්ප හා කුසලතා ඇති කර ගනියි.<br>• නිර්මාණාත්මක හැකියාවන් දියුණු කර ගනියි.<br>• සෞන්දර්යාත්මකව රස වින්දනය කරයි.<br>• කලාව පිළිබඳ සොයා ගැනීම් කර ඒවා නවතාවකින් ඉදිරිපත් කරයි. |

| ජාතික පොදු අරමුණු | විෂය අරමුණු |
| --- | --- |
| VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන, ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපනය මඟින් මානව සම්පත් සංවර්ධනය කිරීම | • ජන සන්නිවේදන කුසලතාව ලබයි.<br>• නව තාක්ෂණික උපකරණ භාවිතා කිරීමේ කුසලතාව ලබයි.<br>• කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීමේ කුසලතාව ලබයි. |
| VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැස්වීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම | • එදිනෙදා ජීවිතය සඳහා අවශ්‍ය මූලික අභ්‍යාස කරයි. |
| VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යොන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම. (උපුටා ගැනීම - ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව - 2003) | • නර්තන කලාකරුවෙක් වීමට අවශ්‍ය පෞරුෂයක් ගොඩනගා ගනියි.<br>• විවිධ වූ දේශීය කලා අධ්‍යයනය කර ඇගයීමට ලක් කරයි.<br>• ස්වයං ලෙස ඉදිරිපත් වී කැපවීමෙන් කටයුතු කිරීමේ කුසලතාව ලබයි. |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 පරිසරය විචාරශීලී ව රස වින්දනය කරයි. | 1.1 ගැමි නර්තනවල දී යොදාගන්නා සංගීත භාණ්ඩ අගය කරමින් ඒවා ගැන අදහස් ප්‍රකාශ කරයි. | ♦ ගැමි වාද්‍ය භාණ්ඩ<br>• ඩොල්කි<br>• උඩැක්කිය<br>• හාර්මෝනියම්<br>• පන්තේරු<br>• නාදස්වරම්<br>• දවුල<br>• බෙරය | • ගැමි සංගීත භාණ්ඩ හඳුනාගෙන නම් කරයි.<br>• ගැමි සංගීත භාණ්ඩවලින් නිකුත් වන වෙනස් වූ හඬ හඳුනා ගනියි.<br>• මෙම සංගීත භාණ්ඩ වාදනය කරන අවස්ථා නම් කරයි. | 04 |
| | 1.2 ආගමික හා සංස්කෘතික අවස්ථා අගය කරමින් අදහස් ප්‍රකාශ කරයි. | ♦ අංග රචනය<br>• ''වේට්ටෙත්තිරුවිළා''<br>• කැරොල්<br>• සූරන්පෝර්<br>• පෙරහැර | • අංගරචනය ගැන කරුණු ඉදිරිපත් කරයි.<br>• ''වේට්ටෙත්තිරුවිළා'' සහ සූරන්පෝර් පැවැත්වීමේ අරමුණ ගැන කරුණු සොයා ඉදිරිපත් කරයි.<br>• කැරොල් හා පෙරහර පවත්වන අවස්ථා පිළිබඳ අදහස් ප්‍රකාශ කරයි. | 04 |
| | 1.3 පාසලේ පවත්වන විවිධ උත්සවයන්වල දී ඉදිරිපත් කරන නර්තන අංග රස විඳ ඒ පිළිබඳ අදහස් ප්‍රකාශ කරයි. | • පාසල්වල පවත්වන කලා වැඩසටහන්වල ලක්ෂණ | • පවත්වන ලද කලා වැඩසටහන් පිළිබඳ අදහස් ප්‍රකාශ කරයි.<br>• ඒවායේ දී ඉදිරිපත් කරන ලද ගීත ගායනා කරයි.<br>• නර්තන අංග සම්බන්ධ රංග වින්‍යාස හඳුනා ගනියි.<br>• රංග වස්ත්‍රාභරණ, අංග රචනය විචාරයට ලක් කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 2.0 පරිසරයේ තමා දක රස විඳි විවිධ වූ ගීත හා කෝර්වෙ අභිරූපණය කරයි. | 2.1 මනඃකල්පිත වූ වාක්‍ය නර්තන මාධ්‍යයෙන් ඉදිරිපත් කරයි. | උදා ඃ -'' කෝවිල් සීනුව නාද විය'' - ''ඇය ලස්සනට නැටුවා ය'' | • මනඃකල්පිත වූ වාක්‍ය නර්තන මාධ්‍යයෙන් ඉදිරිපත් කරයි. | 02 |
| | 2.2 'භාරතියාර්'ගේ ගීත සඳහා නර්තන අංග නිර්මාණය කර ඉදිරිපත් කරයි. | • ''කාක්කෙච්චිරහිනිලේ නන්ද ලාලා''<br>• ''ඕඩි විලෙයාඩු පාප්පා'' | • භාරතියාර්ගේ ගීත සඳහා අභිරූපණය ඉදිරිපත් කරයි.<br>• ''කාක්කෙච්චිරහිනිලේ නන්ද ලාලා'' හා''ඕඩි විලෙයාඩු පාප්පා'' යන ගීත සඳහා අභිරූපණ කර ඉදිරිපත් කරයි. | 04 |
| | 2.3 ගැමි නර්තන භාවාත්මක ව ඉදිරිපත් කරයි. | • කරහම් | • කරහම් නමින් හඳුන්වන නර්තනය විවිධ වූ රටා අනුසාරයෙන් නිර්මාණය කර ඉදිරිපත් කරයි. | 04 |
| 3.0 භරත නර්තන සම්ප්‍රදායයට අදාළ මූලික අභ්‍යාස අඩවු විවිධ පේශී ක්‍රියාකාරකම් ජාති හස්තාංග නර්තන උරුප්පඩි ආදිය අභිනයෙන් ඉදිරිපත් කරයි. | 3.1 අසම්යුද, සම්යුද හා හස්තාංගවල විනියෝග නර්තන මාධ්‍යයෙන් ඉදිරිපත් කරයි. | ♦ විනියෝග<br>• තනි අත් විනියෝග (කාංගුලම්, තිරිසූලම්)<br>• දෙ අත් විනියෝගම් අංජලි - කපෝදම් | කාංගුලම්- තිරිසූලම් තෙක් වූ තනි අත් මුද්‍රාව විනියෝග නර්තන මාධ්‍යයෙන් ඉදිරිපත් කරයි.<br>අංජලි - කපෝදම් යන මුද්‍රා විනියෝග අභිරූපණය කරයි. | 11 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 3.2 භරත නාට්‍යයේ මූලික අඩවු නර්තන අභිරූපණය කර ඉදිරිපත් කරයි. | • තත් තෙයි තාම් 4,5,6<br>• මණ්ඩියඩවු 1,2<br>• තාහත්ත<br>• ජෙම්තරිතා<br>• තෙයි තෙයි තිතිතෙයි<br>• තිතිතෙයි<br>• තතිංගිණතෝම් | • තත් තෙයි තාම් 4-6,6 තාහතජම් තරිතා, මන්ඩියඩවු තතිංගිණතොම්, තෙයි තෙයි තතිතෙයි යන අඩවු තාලයට අනුව ඉදිරිපත් කරයි<br>. | 27 |
| | 3.3 හස්ත භේද ඉදිරිපත් කරයි. | • දේව හස්ත<br>• නවග්‍රහ හස්ත<br>• ජාති හස්ත | • දේවර්, නවග්‍රහ, ජාතිවල නම් ලැයිස්තුගත කරයි.<br>• ඒවාට අදාළ මුද්‍රා උපයෝගි කර ගනිමින් අභිරූපණය කරයි. | 03 |
| | 3.4 විවිධ වූ ගැමි නර්තන අභිරූපණය කර දක්වයි. | • බෝල නැටුම | • බෝල නැටුම ගැමි තාලයට අනුව ඉදිරිපත් කරයි.<br>• විවිධ රටා මතු කරමින් නර්තන අංග ඉදිරිපත් කරයි. | 04 |
| | 3.5 අලාරිප්පු නර්තනයේ ප්‍රධාන ක්‍රියාකාරකම් සඳහා වන පෙර පුහුණුවීම් කරයි. | • අලාරිප්පුවල ප්‍රධාන ක්‍රියාකාරකම් සඳහා වන පෙර පුහුණුවීම්<br>- අට්ටම්,<br>- උරහිස් ගැස්සීම<br>- මණ්ඩියඩවු | • අලාරිප්පුවල ප්‍රධාන ක්‍රියාකාරකම් සඳහා වන පෙර පුහුණුවීම්වල නිරත වෙයි.<br>(අට්ටම්, තෝල් තල්ලු කිරිම මණ්ඩියඩවු) | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 4.0 නර්තනයේ මූලික අංග සහ සංකල්ප විස්තර කරයි. | 4.1 හස්තංග හා භේද හඳුනා ඒවා සඳහන් ප්‍රකාශ කරයි. | • දේව හස්ත<br>• නවග්‍රහ හස්ත<br>• ජාති හස්ත | දේවර්, නවග්‍රහ , ජාතිවලට අදාළ මුද්‍රා ලැයිස්තුගත කරයි. | 03 |
| | 4.2 භරත නැටුම්වල මූලික අඩවුවල ප්‍රස්තාර සංකේත හඳුනා ගනියි. | ♦ ප්‍රස්තාර සංකේතවල විස්තර<br>• තත් තෙයි තාම්<br>• තාහත්ත ජෙම් තරි තා<br>• මණ්ඩියඩවු<br>• තතිංගිණතොම්<br>• තිතිතෙයි<br>• තෙයි තෙයි තිතිතෙයි | • තත්තෙයි තාම්, තාහත ජම් තරි තා, මණ්ඩියඩවු, තතිංගිණතොම්, තෙයි තෙයි තිතිතෙයි, තිතිතෙයි යන අඩවු ප්‍රස්තාර සංකේත අනුව ලියයි. | 10 |
| | 4.3 භරත නැටුම්වල සංකල්ප හඳුනා ප්‍රකාශ කරයි. | • අඩවු<br>• කෝර්වෙ<br>• තීර්මානම්<br>• එඩුප්පු<br>• මුද්‍රා<br>• විනියෝගම්<br>• සොට්කට්ටු<br>• සභාව<br>• සභා මණ්ඩපය<br>• සභානායක<br>• අලාරිප්පු, ලක්ෂණ<br>• කිංකිණි | • අඩවු, කෝර්වෙ, තීර්මාණම්, එඩුප්පු මුද්‍රා විනිගෝගම්, සොට්කට්ටුවල සංකල්ප හඳුනාගෙන ප්‍රකාශ කරයි.<br>• සභාව, සභා මණ්ඩපය, සභානායක, අලාරිප්පු, ලක්ෂණ කිංකිණි ආදියේ ලක්ෂණ ලැයිස්තුගත කරයි. | 07 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 5.0 නර්තනයේ සංස්කෘතික පසුබිම හා ඓතිහාසික පසුබිම හඳුනාගනියි. | 5.1 කලාව සංවර්ධනය කළ ශිල්පීන්ගේ ඓතිහාසික පසුබිම අගයමින් විස්තර කරයි. | • තංජෙයි නාල්වර් හඳුනාගෙන ඔවුන් පිළිබඳ තොරතුරු හා කලාවට දක්වූ දායකත්වය ප්‍රකාශ කරයි. | • තංජෙයි නාල්වර් සිවුදෙන පිළිබඳ තොරතුරු හා ඔවුන් කලාවට දක්වූ දායකත්වය ආදිය පිළිබඳ ව කරුණු සොයා ඉදිරිපත් කරයි. | 02 |
| | 5.2 නාට්‍ය නාටකම්වල පසුබිම පිළිබඳ ව කරුණු විස්තර කරයි. | • නෘට්‍ය නාටකම් | • නාට්‍ය නාටකම හඳුනාගෙන විස්තර කරයි.<br>• නාට්‍ය නාටකම කතා පුවත් අභිරූපණය කරයි. | 02 |
| | 5.3 ලාංකේය සාම්ප්‍රදායික නර්තනවල සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරයි. | • උඩරට නර්තනය | • උඩරට නර්තනය ශ්‍රී ලාංකේය ජනයාගේ සාම්ප්‍රදායික සම්භාව්‍ය නර්තන ක්‍රමවලින් එකක් බව ප්‍රකාශ කරයි.<br>• එහි ආරම්භය ගැන කරුණු ඉදිරිපත් කරයි. | 03 |